# සීමාසහිත සීනෝර් පදනම

## ව්‍යාපාර ව්‍යූහය

**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා ධීවර කර්මාන්තය සඳහා වූ ධීවර යාත්‍රා, විනෝද යාත්‍රා නිෂ්පාදනය හා ධීවර ආම්පන්න අලෙවිය සඳහා ස්ථාපිත පූර්ණ රජය සතු සමාගමකි.**

## සාමාන්‍යාධිකාරී (HM 1-3)

❖ **සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී / විද්‍යාවේදී / කළමනාකරණ /නීති/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය හෝ මුදල් ප්‍රථම උපාධියක් සමග විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සමග යාත්‍රා නිෂ්පාදනය කිරීම, සැලසුම් කිරීම හා ව්‍යාපාර ප්‍රවර්ධනය පිළිබඳ දැනුම හා පළපුරුද්ද ලබා තිබීම

සහ

**පළපුරුද්ද**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර (15) ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. මෙම වසර 15 න් අවම වශයෙන් වසර 03 ක් පශ්චාත් උපාධි වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව විය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

සීමාසහිත සීනෝර් පදනමේ "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" (HM) සේවා ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

❖ **වයස**: අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ .

❖ **වැටුප** : 2020.01.01 දිනට වැටුප රු. 86,865/=

❖ **වැටුප් පරිමාණය**

HM 1-1 2016 රු.86,865 15 X 2,270 = 120,915 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව)

❖ **දීමනා** : මාසිකව ප්‍රවාහන දීමනාව, සන්නිවේදන බිල්පත් ගෙවීම්, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව වෘත්තීය දීමනාව, භාණ්ඩාගාර අනුමත ජීවන වියදම් දීමනාව

## මානව සම්පත් කළමනාකරු (MM 1- 1)

## සැපයුම් කළමනාකරු (MM 1- 1)

❖ **සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කලා / නීති/ කළමනාකරණ/ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

"කනිෂ්ඨ කළමනාකාර "සේවා (JM) සේවා ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ පළමු ශ්‍රේණියේ වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම,

❖ **වයස** : අවු 22 ට නොඅඩු හා අවු 35ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ

❖ **වැටුප** : 2020.01.01 දිනට වැටුප රු. 53,175/=

❖ **වැටුප් පරිමාණය**

MM 1-1 2016 රු.53,175 10X 1,375 15X 1,910 = 95,575/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව)

❖ **දීමනා**

මාසිකව ප්‍රවාහන දීමනාව, සන්නිවේදන බිල්පත් ගෙවීම්, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව වෘත්තීය දීමනාව, භාණ්ඩාගාර අනුමත ජීවන වියදම් දීමනාව

## නිෂ්පාදන නිලධාරී (JM 1-1)

❖ **සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීති/ කලා/ කළමනාකරණ (පරිපාලනය) වාණිජ/විද්‍යා උපාධියක් ලබා තිබීම සමග වසර 01 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

කළමනාකරණ සහකාර (තාක්ෂණික / තාක්ෂණික නොවන) සේවා ශ්‍රේණියේ 1 වන ශ්‍රේණියේ අදාළ තනතුරේ වසර 05 කට නොඅඩු පළපුරුද්ද

**වෙනත් :** රජය විසින් පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු කාල සීමාවක පාඨමාලාවක් හදාරා තිබීම හෝ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) 5 මට්ටමට අඩු නොවන්නා වූ සහතිකයක් ලබා තිබීම.

❖ **වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ .

❖ **වැටුප** : 2020.01.01 දිනට වැටුප රු. 42,600/=

❖ **වැටුප් පරිමාණය**

JM 1-1 2016 රු.42,600 - 10 X 755 -18 X 1,135 = 70,580 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව)

❖ **දීමනා** : භාණ්ඩාගාර අනුමත ජීවන වියදම් දීමනාව

## විගණන සහකාර (MA 2- 1)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

සිංහල / දෙමළ භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

තාක්ෂණික නිපුණතා /ප්‍රවීනතා විගණන සහකාර තනතුරට අදාළ තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට අඩු නොවන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

❖ **වයස :** අවු 18 ට නොඅඩු හා අවු 35ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ .

❖ **වැටුප** : 2020.01.01 දිනට වැටුප රු. 30,310/=

❖ **වැටුප් පරිමාණය :**

MA 2-1 2016 රු.30,310 - 10 X 300- 7X350 4X495 20 X 660 = 50,940 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව)

❖ **දීමනා :** භාණ්ඩාගාර අනුමත අන්තර් දීමනාව සහ ජීවන වියදම් දීමනාව

❖ **පොදු කොන්දේසි :**

01. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

02. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත තම අදාළ දෙපාර්තමේන්තුවල, ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා වන අයදුම්පත් (අදාළ සහතිකවල ඡායාස්ථ පිටපත් ද සමග) ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර දින 14 ක් තුළ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු වේ.

**සභාපති, සීමාසහිත සීනෝර් පදනම,**
**90(335), ඩී.ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**

Source: Dinamina (2020.03.02)